
# සසුන් කෙත රැක්මට බැඳුණු රන්වැට
# 18-පාඩම




ගුංගමුව කනිෂ්ඨ විද්‍යාලය

බැල්ලන්තුඩාව-බණ්ඩාරගම

ථේරවාදී බෞද්ධ ශාසන ඉතිහාසයේ ධර්ම සංගායනා හයක් පැවත්විණ. ඉන් ඔබ ඉගෙන ගන්නේ පළමුවන ධර්ම සංගායනාව පිළිබඳවයි




# පළමුවන ධර්ම සංගායනාව

## පැවැත්වීමට ආසන්නතම හේතුව

- බුදුරජාණන් වහන්සේගේ පිරිනිවන් පෑම හේතුවෙන් හඬන වැළපෙන භික්ෂූන් වහන්සේලාට සුභද්‍ර නම් භික්ෂුව,

**"ඇවත්නි, ශෝක නොවන්න,නොවැළපෙන්න ඒ මහා ශ්‍රමණයාගෙන් අපි මිදුණෙමු. මෙය කැපය.මෙය අකැපය යනුවෙන් නීති පැණවීමෙන් අපි මෙතෙක් කල් පීඩා වින්දෙමු. දැන් අපට කැමති දෙය කළ හැකිය.අකමැති දෙය නොකළ හැකිය."**

යනුවෙන් ප්‍රකාශ කිරීම.



# සංගායනාව පැවැත් වූ කාලය

- බුදුරජාණන්වහන්සේ පිරිනිවන් පා මාස තුනකට පසුවය.

# සංගායනාව පැවැත් වූ ස්ථානය

- මගධ රාජ්‍යයේ රජගහ නුවර වේභාර පර්වතය පාමුල සප්තපර්ණී ලෙන ඉදිරිපිට

# සංගායනාව පැවැත්වීමට අනුග්‍රහය ලබා දුන් රජු

- අජාසත් රජතුමා

# සංගායනාවට මූලිකත්වය ගත් මහරහතන් වහන්සේ

- මහා කාශ්‍යප මහරහතන් වහන්සේ

# සංගායනාවට සහභාගී වූ රහතන් වහන්සේලා ගණන

- 500යි.

# ධර්ම සංගායනාව පැවැත් වූ කාල සීමාව

- මාස 7යි.



# ධර්ම සංගායනාව පැවැත්වූ ආකාරය

මූලාසනය

↓

මහාකාශ්‍යප මහරහතන් වහන්සේ

ධර්මය පිළිබඳව ආනන්ද රහතන්වහන්සේගෙන් විමසීම

විනය පිළිබඳව උපාලි මහරහතන් වහන්සේගෙන් විමසීම

# ධර්ම සංගායනාවේ ප්‍රතිඵල

- විනය කොටස් පහකට බෙදා එය ඉදිරියට පවත්වා ගෙන යාමට උපාළී මහරහතන් වහන්සේ ප්‍රමුඛ ශිෂ්‍ය පරම්පරාවට පැවරීම. විනය බෙදූ කොටස් පහ නම්’

1. පාරාජිකා පාළිය
2. පාචිත්ත පාළිය
3. චුල්ලවග්ග පාළිය
4. මහාවග්ග පාළිය
5. පරිවාර පාළිය

- **ධර්මය කොටස් පහකට බෙදා (නිකාය 5 කට) විශේෂඥ භික්ෂූන්ට පැවරීම.**

1) දීඝ නිකාය- ආනන්ද තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට
2) මජ්ඣිම නිකාය- සැරියුත් තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට
3) සංයුක්ත නිකාය- මහා කාශ්‍යප තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට
4) අංගුත්තර නිකාය- අනුරුද්ධ තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට
5) ඛුද්දක නිකාය- සියලුම තෙරුන් වහන්සේලාට

- සම්බුද්ධ ශාසනයේ නායකයා ධර්මය සහ විනය බව තහවුරු කිරීම.
- බුද්ධානුබුද්දක ශික්ෂා පද ඒ අයුරින්ම ඉදිරියට පවත්වාගෙන යාමට තීරණය කිරීම.
- ආනන්ද හිමියන්ට එල්ල වූ චෝදනාවලින් උන්වහන්සේ නිදහස් වීම.

# පළමු ධර්ම සංගායනාවට කියන තවත් නම්

- පංච සතිකා

# පළවන ධර්ම සංගායනාවෙන් ගත හැකි ආදර්ශ

- විනය ගරුකත්වයේ හා නීති ගරුකත්වයේ වැදගත්කම අවධාරණය කිරීම.
- සාකච්ඡාවෙන් සාමූහිකව තීරණවලට එළඹීම.
- සාමූහික කටයුත්තක දී ඒ සඳහා මූලිකත්වයට සුදුසු අයකු පත් කර ගැනීම.
- ගැටලු විසඳීමේදී බුද්ධිමතුන්ගේ හා විශේෂඥයින්ගේ දැනුම ලබා ගැනීම.
- යම් යම් ගැටලු මතුවට ඇතිවීම වළක්වාලීමට  අවශ්‍ය වැඩ පිළිවෙළක් ඉදිරිපත් කිරීම.

# පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

1. පළමු ධර්ම සංගායනාව පැවැත්වූයේ බුද්ධ පරිනිර්වාණයෙන් කොපමණ කලකට පසුව ද?
2. පළමු ධර්ම සංගායනාව පැවැත්වීමට ආසන්නතම හේතුව කුමක් ද?
3. පළමු ධර්ම සංගායනාවේ මූලිකත්වය ගත් මහරහතන් වහන්සේ කවුද?
4. පළමු ධර්ම සංගායනාවට අනුග්‍රහය දැක්වූ රජතුමා කවු ද?
5. පළමු ධර්ම සංගායනාව පැවැත්වූයේ කොහෙදී ද?
6. පළමු ධර්ම සංගායනාවට සහභාගී වූ රහතන් වහන්සේලා ගණන කීය ද?
7. පළමු ධර්ම සංගායනාවට කියන තවත් නමක් ලියන්න
8. පළමු ධර්ම සංගායනාවේ ප්‍රතිඵල මෙනවා ද?

# පිළිතුරු

1. බුද්ධ පරිනිර්වාණයෙන් මාස තුනකට පසුව
2. සුභද්‍ර භික්ෂුවගේ නොමනා ප්‍රකාශය
3. මහකාශ්‍යප මහරහතන් වහන්සේ
4. අජාසත් රජු
5. මගධ රාජ්‍යයේ රජගහ නුවර වේභාර පර්වතය පාමුළ සප්තපර්ණී ලෙන ඉදිරිපිට
6. 500යි.
7. පංච සතිකා

8

- විනය කොටස් පහකට බෙදා එය ඉදිරියට පවත්වා ගෙන යාමට උපාලි මහරහතන් වහන්සේ ඇතුලු භාණක පරම්පරාවට පැවරීම.
- ධර්මය නිකාය පහකට බෙදා භාණක පරම්පරාවලට පැවරීම.
- සම්බුද්ධ ශාසනයේ නායකයා ධර්මය සහ විනය බව තහවුරු කිරීම
- බුද්දානුබුද්දක ශික්ෂා පද ඒ අයුරින්ම ඉදිරියට පවත්වාගෙන යාමට තීරණය කිරීම
- ආනන්ද හිමියන්ට එල්ල වූ චෝදනා වලින් උන්වහන්සේ නිදහස් වීම